
LANKA COLLEGE OF MINISTRY

A SCHOOL OF GLOBAL UNIVERSITY



# ලංකා දේව සේවා විද්‍යාලය (LCOM) උසස් මට්ටමේ සේවා පුහුණුවක් පිළිගන්වයි

- අන්තර්ජාල පාඨමාලා
- අන්තර් ක්‍රියාකාරී උපදෙස්
- දැරිය හැකි පුහුණුව
- ප්‍රායෝගික විෂය මාලාව
- ගැලපෙන මාතෘකා

## ඔබව අවශ්‍යයි

ශ්‍රී ලංකාවට සාමාන්‍ය මට්ටමෙන් එපිට ගිය පාලකවරු සහ දේශකයන් අවශ්‍යය; ඊට නිර්භීත සහ බලගන්වන ලද නායකයන් අවශ්‍යය. ඵලදායි සභාවලට ජීවිතයේ සෑම අංශයක් හා සමගම සම්බන්ධ වන මනුෂ්‍යයන් අවශ්‍යය. එවැනි බලගන්වන ලද නායකයන් අපගේ ප්‍රේමණීය දේශයේ දේව රාජ්‍යය ඉදිරියට යාමට උපකාර කරනු ඇත. ශ්‍රී ලංකාවට එවැනි නායකයන් අවශ්‍යය... ශ්‍රී ලංකාවට ඔබව අවශ්‍යය!

## ඔබව බලගන්වනු ලැබිය හැක

ශ්‍රී ලංකාවට බලගන්වන ලද දෙවියන්වහන්සේගේ හස්තයක් වන පිණිස ඔබට විශේෂිත දීමනා, දක්ෂතා සහ හැකියාවන් දෙනු ලැබ ඇත. සේවා සහකරු සහතික පත්‍රය (සේවා සහකරු වැඩසටහනේ කොටසකි) සභාව තුළ සහ ඉන් පිටත දෙවියන්වහන්සේගේ ගැළවීමේ අරමුණු සඳහා ඔබව සන්නද්ධ කිරීමට සහ බලගැන්වීමට උපකාර කරනු ඇත. මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම අන්තර්ජාලයෙන් සැපයේ. එබැවින් ඔබට අවශ්‍ය කරන්නේ අන්තර්ජාල සම්බන්ධතාවක් පමණි. ඔබට යම් ස්ථානයකදී හෝ විශේෂිත කාලයකදී මුණගැසීමක් අවශ්‍ය නොකරයි. මෙම වැඩසටහන විශේෂයෙන්ම කාර්ය බහුල ගිහි අය සඳහා සම්පාදනය කර ඇත.

## සරල ව්‍යුහය

සේවා සහකරු වැඩසටහනට අදියර දෙකක් ඇත. පළමුවැන්න වසර දෙකක් වන අතර එය අවසානයේ ඔබට **සේවා සහකරු සහතික පත්‍රය** ලැබෙනු ඇත. තුන්වන වසර අවසානයේ **සේවා සහකරු උසස් සහතික පත්‍රය** ලැබෙනු ඇත. එකිනෙක අදියරේ එකිනෙක වසර සඳහා පාඨමාලා හයක් තිබේ. වැඩසටහන තුළ රැඳී සිටීම සඳහා සහ ඊළඟ පියවරට යාම සඳහා ඔබ අවම වශයෙන් වසරකට පාඨමාලා හතරක්වත් සම්පූර්ණ කළ යුතුය. නිර්දේශිත පෙළ පොත් අධ්‍යයන පාඨමාලාවක පාඩම්වලින් පාඨමාලාව සමන්විතය. ඔබ එකිනෙක පාඩමේ අන්තර්ගතය අධ්‍යයනය කළ පසු වහාම ශ්‍රේණිගත කිරීම සහ ප්‍රතිචාරය දෙන අන්තර්ජාල ප්‍රශ්න මගින් ඔබගේ දැනුම පරීක්ෂා කළ හැක. පළමු පාඩමේ අන්තර්ගතය සමඟ ඔබට නිසැකකමක් හැඟේ නම් ඔබට ඊළඟ පාඩම අධ්‍යයනය කළ හැක.

## එලදායි මෙවලමක්

සේවා සහකරු වැඩසටහන ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඔබගේ පෞද්ගලික ගමන වර්ධනය කිරීමටත් ඔබට වඩා එලදායි සේවයක් සඳහා වැඩි දියුණු දක්ෂතාවයන් හිමිකර ගැනීමටත් උපකාර කරයි. බයිබලය හොඳින් තේරුම්ගැනීමක්, කිතුනු ජීවිතයේ විවේචනාත්මක අංශවල පැහැදිලි ඇතුලාන්ත දැක්ම සොයාගැනීමක්, සෙනඟ සමඟ ශුභාරංචිය බෙදාගැනීමට සහ ඔවුන්ට එලදායි ගෝලයන් වීමට ඔවුන්ව පෙළඹවීමට නිසැකකමක් ඔබ ලබනු ඇත. ආත්මයාණන් විසින් මඟපෙන්වනු ලබන පාසලක් ලෙස LCOM ඔබට ඉහළ මට්ටමේ ඉගැන්වීම් සපයන අතරතුර සේවය, අනුකම්පාව සහ ශුද්ධකම උදෙසා බලවත් බලගැන්වීමක් උදෙසා මඟපෙන්වීමට උපකාර කරයි.

| මූලික | | උසස් |
|---|---|---|
| පළමුවන ඒකකය | දෙවන ඒකකය | තුන්වන ඒකකය |
| *බයිබලය අධ්‍යයනය කරන්නේ කෙසේද* | *ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවත් වීම* | *වගකීම් දරන කිතුනුවා* |
| *යොහන් ශුභාරංචිය* | *රාජ්‍යය, බලය සහ මහිමය* | *සේවය තුළ සම්බන්ධතා සහ ආචාර ධර්ම* |
| *පුද්ගලික ශුභාරංචි සේවය* | *මූලික සත්‍යතාවයන්* | *ජීවිතයේ ප්‍රශ්න විසඳීම* |
| *ක්‍රිස්තියානි වර්ධනය* | *කූඩාරම්, දේවමාලිගය සහ රජමැදුරු* | *බයිබලීය උපදේශනයට දේව සේවකයාගේ මඟපෙන්වීම* |
| *ප්‍රශ්නවලට මුහුණ දීම* | *දේශනා කිරීම සහ ඉගැන්වීම* | *ඇදහිලිවන්තයන් තුළ ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකිරීම* |
| *බයිබලීය ආචාර ධර්ම* | *ආත්මික දීමනා* | *එලදායි නායකත්වය* |

## ලියාපදිංචි වීම

LCOM අන්තර්ජාල පිටුවෙන් (website) ඔබට සෘජුවම අයදුම්පත්‍රය බාගත (download) කරගැනීමෙන් ලියාපදිංචි විය හැක.

ඔබගේ පාලකතුමා හෝ සභාවේ නායකයා නිර්දේශ කරන අත්සන ඇතුලත් කිරීමට සහතික වන්න. ඉන්පසු අයදුම් පත්‍රය ස්කෑන් (scan) කර infolcom2@gmail.com යන ඊ-මේල් ලිපිනයට යවන්න.



ලංකා දේව සේවා විදුහල සේවා සහකරු වැඩසටහන ඉදිරිපත් කිරීම ගැන මම ඉමහත් සේ උද්යෝගිමත් වෙමි. මුළුමනින්ම අන්තර්ජාල අධ්‍යාපනික වැඩසටහනක් ලෙස එය අපගේ අවශ්‍යතාවයන් ඉතා හොඳින් සපුරාලයි. බොහෝ යහපත් ගිහි වැඩසටහන් ඒවායේ මුළු හැකියාව සම්පූර්ණ කර නොමැත්තේ වෙළෙඳ පළේ සිටින සෙනඟට මෙම වැඩසටහන් අනුගමනය කිරීමට කාලය කැප කිරීමට සිදුව ඇති හෙයිනි. සේවා සහකරු වැඩසටහන් මේ සියල්ල ජයගන්නා අතර, එලදායි සහ පහසු ගිහි අධ්‍යාපන වැඩසටහනක් අපගේ සභාවලට ලබා දෙයි.

දෙවියන්වහන්සේගේ අරමුණ සම්පූර්ණ කිරීම සඳහා මෙම අවස්ථාව ග්‍රහණය කරගන්නා ලෙස අපගේ සියලු ගිහි අයව ධෛර්යමත් කිරීමට මම කැමැත්තෙමි.

ඩිෂාන් වික්‍රමරත්න, සභාපති, එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්, ශ්‍රී ලංකාව

අන්තර්ජාල අධ්‍යයනය මුහුණට මුහුණලා ඉගෙනගැනීමට ආදේශකයක් නොවේ. නමුත් එය ඊට වටිනා එකතුවක් විය හැක. අද කාර්ය බහුල කිතුනු නායකයන්ට ඔවුන්ට පහසු ස්ථානයක සහ වේලාවක දෙවියන්වහන්සේගේ කාරණා සහ උන්වහන්සේගේ සේවය ඉගෙනගැනීමට අවස්ථාවක් සලසා දෙයි. මම මෙම නිර්භීත උත්සාහය පසසන අතර, බොහෝ අයට වෙනත් මාර්ගයකින් ලබාගත නොහැකි පුහුණුව ලැබීමට මෙය අවස්ථාවක් ලබා දෙන පිණිස මම යාච්ඤා කරමි.

අජිත් ප්‍රනාන්දු, අධ්‍යාපන අධ්‍යක්ෂක, යූත් ෆො ක්‍රයිස්ට් සභාපති, ශ්‍රී ලංකාව

